# සංක්‍රමණිකයකුගේ සටහන

## යුද්ධය හා සාමය

සශක හතරකට ආසන්න කාලයක් පුරා වර්ධනය වෙමින් ආ යුද්ධය පසුගිය සතියේ නව අවධියකට පිවිසුනා. බොහෝ දෙනා දැං කතා කරන්නේ දැං කුමක් කරමුද කියා යි. මේක දීලා දාමුද? මුන්ට ගහලා දාමුද? ගහන්න තමයි දැං අපේ කට්ටියගේ මානසිකත්වය හැඩ ගැහිලා තියෙන්නේ. ඒත් සිදු නොවන්නෙත් ඒකයි. හමුදාපති ට පහර දීම කොටින්ගේ අවසානයයි සිතනවා නම් ඒක මුලාවක්. මෙවැනි තීරනාත්මක අවස්ථා කීයක් නම් අපි පසුගිය කාලය තුල පසුකලාද? දැන්වත් අපි මේ සිදුවෙමින් පවතින්නේ කුමක්දැයි අවබෝධ කරගත යුතු වෙනවා. දින නිය  මිතව තිබූ සාම සාකච්ඡා ගැන මුලු ලොවම අවධියෙන් සිටින මොහොතක කොටි මෙවැනි ප්‍රහාරයක් එල්ල කලේ කෙසේ දැයි අප සිතිය යුතුයි. ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට පත්වන බව දැන දැනත් ජනප්‍රිය ජනාධිපතිවරයෙක් හා අලුත්ම ආන්ඩුවක මර්මස්ථානයට පහර දීමට තරම් එඩිතර වීම පසුපස ඇති බලවේගය ගැන අප අවධියෙන් සිටිය යුතුයි. අප කළ යුත්තේ මෙය කොටින්ගේ ස්වභාවය යයි සරළව සිතීම නොවේ. මොවුන් හසුරුවන ආකාරය ගැන යථා අවබෝ දයෙන් හමුදාව යොදා ක්ෂනිකව ප්‍රතාප්‍රහාර එල්ල කිරීම යනු ඕනෑම ආන්ඩුවකට ගත හැකි සරලම ක්‍රියා මාර්ගයයි. එහෙත් මේ සා ඔඩු දුවා ඇති ප්‍රශ්නයකට පිලියම් සෙවිය යුත්තේ එවැනි ක්ෂනික ජන මන පිනවීමේ ක්‍රියාමාර්ග වලින් නොව දීර්ඝකාලීන දූරදර්ශී වැඩ පිලිවෙලක් තුලිනි.

යුද්ධය හෝ සාමය උදාකරගත හැක්කේ එක වැඩකින් නොව වැඩ මාලාවක් තුලිනි. ශිෂ්ට සම්පන්න මිනිසුන් ලෙස අප සියලු දෙනාම සාමයට කැමැති ය. එහෙත් ප්‍රශ්නය සාමකාමීව විසඳීමට නොහැකි නම් අකැමැත්තෙන් වුව ද තෝරා ගත යුත්තේ අනෙක් ක්‍රියා මාර්ගයයි. නූතන යුද්ධය යනු අප රජ කතාවල අසා ඇති යුද්ධය නොවේ. එය ඊට බෙහෙවින් වෙනස් ආකාරයක් ගනියි. මේ යුද්ධය හමුදාවකට පමණක් කල හැකි එකක් නොවේ. ඒ සඳහා මුළු රටම සූදානම් කල යුතු ය. මුළු ලොවම දැනුවත් කල යුතු ය. කවුරුක් කැමති වුවත් අකැමැති වුවත් කල යුතු දේ කල යුතු ය. නියම නායකයෙකු වශයෙන් හැඳින්විය හැක්කේ ජනතාවට අවශ්‍ය පරිදි තීරණ ගන්නා පුද්ගලයෙකු නොව තමන්ගේ දර්ශනයට ජනතාව පෙල ගැස්සවිය හැකි තැනැත්තෙකුටය. එහෙම නායකයකු නොඑනතාක් මේ සටන මෙසේම අඩු වැඩි වශයෙන් ඉදිරියට යනු ඇත.  අවසන් වශයෙන් මේ සටනේදී විදේශ ගත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ඔස්ට්‍රේලියාවේ ස්පර් සංවිධානය දැඩි කෙනෙහිලිකම් මැද වුව ද කරන සේවයට ප්‍රසංසා කල යුතු ය. එය විදේශගත ශ්‍රී ලාංකික රාජ්‍ය නියෝජිතයනට පාඩමක් ද උගන්වයි.

## මැයි දිනය

තවත් ලෝක කම්කරු දිනයක් පහුඋනා. පක්ෂයේ සංවිධානයේ ශක්තිය බලය සෙනඟ ලොවට පෙන්වීමේ තරගය උදෙසා පිට පලාත් වලින් බුරුතු පිටින් බස් වල නංවා කෑම පැකට්ටුවක් හා රුපියල් 500 ක් අතට දී කොළඹට ගෙන ඒමත්, මෙල්බන් ට්‍රේසි හෝල් එක ළඟ ඉඳලා බියර් බී සොසේජ් කා සැනසිල්ලේ බැනර් එකකුත් ඔසවාගෙන ඇල්බර්ට් පාක් එකට පෙලට ඇවිදගෙන ඒමත් අතර මොන අන්දමින් ගත්තත් වෙනසක් නැහැ. හැම දෙයක්ම වෙනස් වෙලා. කම්කරු ශ්‍රමයේ බලය එකමුතු කම සටන්කාමීත්වය පෙන්වීමේ ආදර්ශය දදැං අතීතයට එක් වෙලා හමාරයි. වෙනස් නොවී තියෙන්නේ කම්කරු ගීතය විතරයි.

සා දුකින් පෙළන වුන් දැන් ඉතින් නැගිටියව්......

## Mother's day

ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වු මුල් කාලයේ දී මේ මව්වරුන්ගේ පියවරුන්ගේ දින පිලිබඳව මගේ තිබුන ආකල්ප දැන්නම් දියවෙලා ගිහින්. ඒත් තවමත් අපි බොහොම දෙනෙක් අපේ ගුවන් විදුලිය පවා එදාට ගීත වලිනුත්, වැඩසටහන් වලිනුත් උත්සාහ කරන්නේ මේ දින පිලිබඳව උපහාසයක් එල්ල කරන්නයි. ඒත් මේකේ හාස්‍යජනක පැත්ත නම් මේ බොහොම දෙනෙක් ම විහිලුවට හරි තමන්ගේ සැමියන්ට බිරිඳට එදාට තෑග්ගක් අරන් දෙන එකයි. දරුවෝ නිසා ඒක කරන්නම වෙලා. මුල් කාලේ කෙසේ වෙතත් මෙහි ජනතාවගේ ප්‍රධාන ප්‍රවාහයට එක්වෙලා ඒ සංකීර්න දිවියට හුරු වුනාම තේරුම් යන දෙයක් තමයි මේ මිනිස්සුන්ට එහෙම දිනයක් වත් නැ.ත්නම් දෙමව්පියන් බලන්න යන්න වෙන්නෙ ඔවුන්ගේ මලගෙදරට පමණක් විත්තිය. බොහෝ වේලාවට අපි තේරුම් නොගන්නා බව පෙන්වන අපේ එකිනෙකා හා බැඳුනු සංස්කෘතිය හා බැඳී වෙන්වන සංස්කෘතිය අතර ඇති වෙනස් ගති පුරුදු වලට අපි අපහාස උපහාස කලා ඇති කියලයි මට හිතෙන්නේ. අපේ මේ පරම්පරාව පවතින තාක් අපි අගය කරන දේ රැඳී තියේවි. ඊළඟ පරම්පරාව දැනටමත් වැළඳගනිමින් ඉන්නෙ කුමන දේද යන්න රහසක් නෙවෙයි. ඒ නිසා අපටත් කවදා හෝ මේ දේට මුහුන දෙන්න වේවි. ඒ නිසා ඒකට හිනා නොවී දැන්ම තියා හුරු වෙන එක වඩා හොඳයි, අපි ජීවත් වෙන්නෙ ඔස්ට්‍රේලියාවෙ නිසා.

## වෙසක්

පන්සලේ , ජ්ලියේ, කොවිලේ දැල්වෙන්නේ එකම පහනක් කියන්නේ වෙළඳ දැන්වීමක්. වෙලෙන්දෝ නිතරම කතා කරන්නෙ ගින්දර ගැන විතරයිනෙ. කොයි පහනෙත් තියෙන්නේ ගින්දර තමයි. ඒත් මේ ගින්දර සංකේතවත් වන්නේ ආලෝකය හා ප්‍රඥාවයි. ලොව පහලවුනු හැම ශාස්තෘවරයෙක්ම උතාසාහ කලේ ලොවට ප්‍රඥාව ලබා දෙන්නයි. එහෙත් හැම විටම තමා පසුපස එන්න නොකියූ, තමා අනුගමනය කරන්න නොකියූ, තම අන පිලිපදින්න නොකියූ ලොව එකම ශාස්තෘවරයා බුදුන් වහන්සේ යි. තමුන්ගේ දහම නැන නුවනින් විමසා බලා තමනට ගැලපෙන්නේ නම් පමනක් ඊට අනුගත වන්න යයි වදාලේ උන් වහන්සේ පමනයි. මේ වෙසක් දිනයේ දී අපි උන් වහන්සේ සැමරිය යුතු මූලිකම ගුනාංගයද වන්නේ එයයි. ශ්‍රී ලංකාව තුල නම් ප්‍රතිපත්ති පූජාවට වඩා ආමිස පූජාව ඉදිරියට පැමින තිබුනත් මෙහි එවැනි තත්වයක් තවමත් නොමැති වීම සතුටට කරුනක්.


සූරිය SOORIYA
ශ්‍රී ලාංකික වෙළඳසල

මේ පොත් දැන් සූරිය මාකටිං සර්විසස් වෙතින් තැපෑලෙන් ලබාගන්න

ප්‍රවීන ලේඛක ඩී බී කුරුප්පු ගේ — DB Kuruppu's

| | | | |
|---|---|---|---|
| හැන්දෑවට පායන හිරු | ඩොලර් 20 | Saradiel | $ 5 |
| එක්තරා ප්‍රේම කතාවක් | ඩොලර් 5 | Mahadena Mutta | $ 8 |
| අර්ධනාරී | ඩොලර් 20 | Kekille | $ 2 |
| ලංකාවක් වගේ පුංචි | ඩොලර් 8 | Andare | $ 5 |
| කයිරෝව කුඩා නගරයකි | ඩොලර් 10 | Garayaka | $ 6 |
| නිර්මාණ චිත්තරූප | ඩොලර් 12 | Surrender or Betrayal | $ 5 |
| සිංගරු සිරිත | ඩොලර් 12 | Folk Tales of Sri Lanka | $ 5 |
| අන්තිම උපන්දින සාදය | ඩොලර් 10 | At My Fathers Feet | $ 5 |
| සංගම්කාරයාගේ මළගම | ඩොලර් 10 | | |
| විප්ලවය ආවොත් | ඩොලර් 10 | | |

වෙනත් පොත් — පොතක මිල ඩො 10

**ජයකොඩි සෙනෙවිරත්න**
ඇස් බැන්දුම
අග මෙහෙසිය
සොල්දර ගෙදර
**ආර් ආර් සමරකෝන්**
අකලංක
**පියසේන ජයකොඩි**
තෙර තරණය
රන් දහඩිය
**කරුණාරත්න ඩී පිලිප්**
රත්තරන් දුවේ

**විමල් තිලකරත්න**
ඉසුරු විජිතය
**පර්සි තේනුවර**
හන්තානා කඳු මුදුන සිසාරා
**ඩී එම් පී පාදෙනිය**
වසවර්තියෙක් ද නොවීම්
**ජයන්ත මංගල රාජපක්ෂ**
තුන් යාමයේ සිහිනය
**සුජීව ප්‍රසන්නආරච්චි**
සින්දූර් 4

**බෞද්ධ පොත්**
ඓතිහාසික කුඩුම්බි ගල
සම්මා සම්බුද්ධ ධර්ම දේශනා
මහා කප්පින හාමුදුරුවෝ
මහා කච්චාන හාමුදුරුවෝ
සම්බුදු හිමි අසම සමයි
**විවිධ**
**මාලිංග අමරසිංහ**
සීගිරිය
**කේ එච් ජේ යිජේදාස**
සිංහල ජාතිය පාවා දීම

සියලුම පොත් සඳහා තැපැල් හා දැවටුම් ගාස්තු පොතකට ඩොලර් 2
චෙක්පත් සහ මුදල් ඇනවුම් Sooriya Marketing Services නමින් ලියන්න

Sooriya
Marketing Services
22 Lorne Street
Lalor Vic 3075
Tel 03 9402 5380